// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1989/13 - 2016 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා - 2016.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරලයේ මැදපත්තුව සුළු කොට්ඨාසයේ උඩ කරවිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කරවිට ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත 2016/08/18 දිනැති අ.ග.සි. 39 හා අතිරේක 64 පත්‍ර 83 දරන පිඹුරේ කැබලි අංක 2197 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0506ක් පමණ වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබැල්ල.

1. **කැබලි අංක 2197**

ඉඩමේ නම: දෙල්ගොඩගේවත්තහේන (දෙල්ගහවත්තහේන, පිල්ලබඩහේන, කිරාලාගේවත්තහේන, අරඹගෙවත්තහේන); මුල් හිමිකම්පාන්නා: විහාරාධිපති, උඩ කරවිට ශ්‍රී ඉසිපතනාරාමය, උඩ කරවිට; බිම් ප්‍රමාණය: හෙක්. 0.0506.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016/12/14 වැනි දින පෙ. ව. 9.30ට නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 දෙසැම්බර් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එම්. එස්. අවන්ති සේනාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නිවිතිගල.

2016 ඔක්තෝබර් මස වැනි දින,
නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11—93

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24386 - 17 (2016/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.